# සංචාරක කර්මාන්තය සඳහා බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිම යොදාගැනීමේ වැදගත්කම

ඩබ්.ඒ.ඩී.වී. මධුෂාණි[1], පී.එන්. රාජපක්ෂ

මිරිදිය, කරදිය, කෘත්‍රිම තෙත්බිම් අතර මිරිදිය තෙත්බිම් ගණයට බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිම අයත් වේ. මෙය සංචාරක ව්‍යාපාරයට ඉවහල් කරගත හැකි ද යන පර්යේෂණ ගැටලුව මත පදනම්ව මෙම අධ්‍යයන සිදුකළ අතර සංචාරක කර්මාන්තය දියුණු කිරීමට මෙම තෙත්බිම යොදාගත හැකි බව පෙන්වීම මෙහි අරමුණයි. අධ්‍යයනයට අවශ්‍ය දත්ත ක්ෂේත්‍ර ගවේෂණය යටතේ සෘජු නිරීක්ෂණය, ඡායාරූපකරණය හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රම භාවිත කරමින් සිදුකරන ලදි. අන්තර්ජාතික රම්සා ප්‍රඥප්තියට අනුව 1989 දී ශ්‍රී ලංකාවේ පිළියෙල කර ඇති තෙත්බිම් ද ඇතුලත් කර ඇති අතර ලංකාවේ තෙත්බිම් අතරින් 33 වැනි ස්ථානයේ බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිමට හිමිවේ. IUCN වාර්තාවලට අනුව අන්තර්ජාතික තෙත්බිම් 41න් තර්ජනයට ලක්ව ඇති තෙත්බිම් 12 අතරට බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිම් අයත් වේ. කොළඹ නගරය ආසන්න පරිවාර නගරයක, කටුනායක ගුවන්තොටුපොළ, දක්ෂිණ අධිවේගී මාර්ගයටත්, දෙහිවල, ගල්කිස්ස මුහුදු ආසන්නව බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිම පිහිටා ඇත. මෙම පිහිටීම නිසාවෙන් තෙත්බිම් ප්‍රදේශය තුළ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක් ප්‍රවර්ධනය කළ හැකිය. S3 සංකල්පය මෙම ප්‍රදේශය දැකගත හැකිය. බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිම හෙක්ටයාර 372 ක භූමි ප්‍රමාණයක විහිදී පවතී. සංචාරක පක්ෂීන්, නේවාසික පක්ෂීන් පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට මෙන්ම වන සතුන් රූපගත කරන්නෙකුට බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිම යෝග්‍යය. සමනල විශේෂ 68 ක්, මත්ස්‍ය විශේෂ 44 ක්, උභය ජීවීන් විශේෂ 15 ක්, උරග විශේෂ 30 ක්, පක්ෂි විශේෂ 168 ක්, ක්ෂීරපායි විශේෂ 17 ක් බෙල්ලන්විල අත්තිඩිය තෙත්බිමේ වාසය කරයි. මෙරටට ආවේනික ශාක වර්ග ද දැකගත හැකිය. බෙල්ලන්විල අත්තඩිය ආසන්නයේ සංචාරක නිකේතන ඇති කිරීම තුළින් තෙත්බිම නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට නවාතැන් පහසුකම් සලසාගත හැකි අතර කුරුල්ලන් නැරඹීමට නැරඹුම් මධ්‍යස්ථානයක් ඇති කිරීම, තෙත්බිම ආශ්‍රිතව දේශීය ආහාරපාන සහිත වෙළඳසැල් ඇතිකිරීම තුළින්. සංචාරක ආකර්ශනය ලබාගත හැකිය. ටිකට්පත් නිකුත් කිරීම තුළින් මෙම තෙත්බිම නඩත්තු කිරීමට අවශ්‍ය මුදල් පහසුවෙන් ලබාගත හැකිය. මෙම තෙත්බිම සංචාරක කර්මාන්තය සඳහා යොදාගත් විට සෘජු රැකියා මෙන්ම වක්‍ර රැකියා අවස්ථා ගණනාවක් නිර්මාණය වේ. තෙත්බිම ආශ්‍රිත ප්‍රදර්ශනාගාරයක් පවත්වා ගැනීමෙන් සංචාරකයන්ට දැකගත නොහැකි මත්ස්‍ය වර්ග ආදී සත්ත්ව විශේෂ සංචාරකයන්ට දැකබලාගත හැකිය. මත්ස්‍ය චිකිත්සක ස්ථාන තෙත්බිම තුළ ඇති කිරීම. සංචාරකයන්ගේ ආරක්ෂාව සඳහා විධිමත් ලෙස පාලම් ඉදිකිරීම වැනි සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම. මෙම තෙත්බිම ආශ්‍රිතව බෙල්ලන්විල රජමහා විහාරය පිහිටා තිබිම නිසා දිය කැපීමේ මංගල්‍යය සිදුකිරීම සඳහා මෙම තෙත්බිම යොදා ගැනීම කිසා එමගින් සංචාරකයින්ට මෙරට පවතින සංස්කෘතික උරුමයන් දැකබලා ගැනීමට හැකියාව ද ඇතිකර හැකිය.

ප්‍රමුඛ පද : ආකර්ශනය, චිකිත්සක, තෙත් බිම්, ප්‍රදර්ශනාගාර, සංචාරක කර්මාන්තය

[1 2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.*vasana.madushani@gmail.com*